

පූර්ව පිටුව 108-9. ගාලු මුවදොර කාලතුවක්කු ඃ පසුබිමෙන් පැරණි පාර්ලිමේන්තුව දිස්වේ.

**11 වැනි පරිච්ඡේදය**

# ශ්‍රී ලංකාවේ යුධ සමය

1939 දෙසැම්බර් මාසයේදී එන්. යූ. එංගලන්තයේ සිට ලංකාවට පැමිණෙන්නේ වැඩි ආත්ම විශ්වාසයකින් යුත් පුද්ගලයකු වශයෙනි. ඒ වන විටදී ලංකා රාජ්‍ය සේවය තුළ සිටි එකම සුදුසුකම් ලත් ආර්ථික විශේෂඥයා ඔහු විය. එංගලන්තයේ ගත කල කාලය, ව්‍යාපාර පරිපාලනය පිළිබඳ විශේෂඥ භාවයක් ලබාගන්නට පමණක් නොව ලෝකයේ අනෙකුත් රටවල ව්‍යාපාර පරිපාලනය සිදු කෙරෙන ආකාරය පිළිබඳ පුළුල් අවබෝධයක් ලබා ගැනීමට ඔහුට අවස්ථාව ලබා දුන්නේය. රාජ්‍ය සේවකයකු වශයෙන් ඔහුගේ වටිනාකම කිහිප ගුණයකින් ඉහළ නැංවී තිබිණ. 1942 දී ශ්‍රී ලංකාව යුද්ධය සඳහා සංවිධානය වන කාලය වන විට ඔහු සිය වෘත්තීය ජීවිතය තවත් එක් තීරණාත්මක අවස්ථාවකට එළැඹියේය. යුධ සමය යනු පැහැදිලිව සිතන්නට හැකි පලදායි පරිපාලකයින් අසීරු අවස්ථාවලදී ක්ෂණිකව, නිවැරදි තීරන වලට නොබියව එළඹිය හැකි පුද්ගලයින් ද පෙල ගැස්වීම අවශ්‍ය වන කාලයයි. මේ ගුණාංග සියල්ලක්ම නොඅඩුව එන්. යූ. සතුව පැවතින. යුධ සමයේ එළඹෙන හදිසි අවස්ථා නමැති අභියෝගයන්ට මුහුණ දීම සඳහා විනයක් සංවිධාන ශක්තිය විසින් හොඳින් සූදානම් කොට තිබිණ. මෙම කාල පරිච්ඡේදය තුළදී, යුධ සමයක අවශ්‍යතාවන් සහ සබඳුනු නිලතල රැසක් දරන්නට එන්. යූ. ට ආරාධනා ලැබිණ.

එංගලන්තයේ සිට පැමිණීමත් සමගම එන්. යූ. සිය සුපුරුදු තනතුරේ නැවත වැඩ භාර ගත්තේය. වාණිජ සහ කර්මාන්ත දෙපාර්තමේන්තුවේ වාණිජ සහකාරවරයකු වශයෙන් වූ එම තනතුරෙහි පෙරටත් වඩා වැඩි වගකීම් දරමිනි. ආණ්ඩුව එන්. යූ. එංගලන්තයේ පුහුණුව සඳහා යැවීමට ප්‍රධානතම හේතුව වූයේ රජයේ සහයෝගය ලබන වාණිජ ව්‍යාපාර ඇරඹීම තුළින් කර්මාන්ත අංශය වැඩි දියුණු කිරීමයි (J.C.W. Rock in N. U. Jayawardena personal files). යුද්ධය අමුද්‍රව්‍ය මෙන්ම භාණ්ඩ හිඟයක් ද නිර්මාණය වී තිබිණ. විශේෂයෙන්ම අපනයනය භාණ්ඩ හිඟ වෙමින් පැවතින. මේ භාණ්ඩ හිඟය රාජ්‍ය වාණිජ ව්‍යාපාර ඇරඹීමේ අවශ්‍යතාවය තවත් ඉහළ නැංවීමට හේතුවක් විය.

මේ ප්‍රතිපත්තිය යටතේ, වාණිජ සහ කර්මාන්ත දෙපාර්තමේන්තුව විසින් ප්‍රථමයෙන්ම පිහිටුවනු ලැබුයේ කොහු කෙඳි කර්මාන්ත ශාලාවකි. මෙම කර්මාන්ත ශාලාව භාරව එන්. යූ. පත් කරනු ලැබිණ. ඔහු විසින් පසුව පවසාතිබූ අන්දමට බ්‍රිතාන්‍යයේදී ලැබූ පුහුණුව ප්‍රායෝගිකව භාවිතයේ යොදන්නට ඔහුට ලැබුණු ප්‍රථම අවස්ථාව මෙයයි.

> දවසකින් අඩක් පමණක් ඒ සඳහා යෙද වූ මට, මාස දෙකක් තුළ කර්මාන්ත ශාලාව ප්‍රතිසංවිධානය කිරීමටත්, කාර්යක්ෂම නිෂ්පාදන පාලන ක්‍රමයක් හඳුන්වා දීමටත් හැකිවිය. එමෙන්ම සාර්ථක අලෙවි වැඩසටහනක් ද ක්‍රියාවේ යෙදවීම්, මේ ක්‍රියාමාර්ග තුළින් පාඩු ලබමින් තිබූ කර්මාන්ත ශාලාව ලාභ දායි ව්‍යාපාරයක් බවට පත් කිරීමට හැකිවිය. (එන්. යූ. ජයවර්ධන පෞද්ගලික ලිපි ගොනු)

1943 දී එන්. යූ. වාණිජ හා කර්මාන්ත දෙපාර්තමේන්තුවේ කර්මාන්තශාලා භාර සහකාර අධ්‍යක්ෂක තනතුරට ඉල්ලුම් කළේය. එංගලන්තයේ අධ්‍යාපනය ලබන කාලය අතරතුර බ්‍රිතාන්‍ය කර්මාන්ත ශාලා තුළ භාවිතා කෙරෙමින් තිබූ නවතම නිෂ්පාදන ශිල්පක්‍රම දැක බලාගෙන තිබූ ඔහුට තමන් උගත් කළමණාකරණ ශිල්ප ක්‍රම ප්‍රායෝගිකව ක්‍රියාවේ යොදවන්නට දැඩි උවමනාවක් තිබුණාට සැක නැත.

වාණිජ සහ කර්මාන්ත දෙපාර්තමේන්තුවේ අලෙවි අංශය සංවිධානය කිරීමේ වගකීම ද එන්. යූ. ට පැවරිණ. අලෙවි අංශය පිහිටුවනු ලැබුනේ රජය විසින් පවත්වාගෙන යනු ලබන කර්මාන්ත ශාලාවල නිපදවෙන භාණ්ඩ අලෙවි කිරීමේ පරමාර්ථයෙනි. අලෙවි සංවර්ධන දෙපාර්තමේන්තුව ලෙසින් හැඳින්වුනු මෙහි අලෙවිසල වැනම් වීදියේ පිහිටා තිබිණ. අලෙවි සංවර්ධන දෙපාර්තමේන්තුව යටතේ පැවැති නිෂ්පාදන කම්හල් වසර ගණනාවකට



119. තේ බහාලුම් නැව්ගත කිරීමට සූදානම් කෙරේ

පෙර පෞද්ගලිකරණය කෙරුනද එම්.ඩී. ලේබලය යටතේ අලෙවි වන භාණ්ඩ අදත් වෙළඳ පොළේ දක්නට ලැබේ. ආණ්ඩුව විසින් ස්ථාපනය කරන ලද ප්‍රථම කම්හල පවත්වාගෙන යාමේ කටයුතු වලට සම්බන්ධව සිටියදී සහ රජයේ කම්හල් වල නිෂ්පාදන අලෙවි කිරීමේ අංශය සංවිධානය කිරීම භාරව සිටියදී එන්. යූ. හොඳින් වටහාගත් තවත් කරුණක් විය. එනම් රජය විසින් කර්මාන්ත පවත්වාගෙන යාම අයෝග්‍ය බවයි. දේශපාලන ඇඟිලි ගැසීම් වල සිට අත්දැකීම් වලින් සහ ප්‍රායෝගික දැනුමින් තොර රාජ්‍ය සේවයකයින්ගේ වැරදි තීරණ ගැනීම් දක්වා කරුනු මේ කර්මාන්ත වලට අහිතකර ලෙස බලපානු එන්. යූ. හොඳින් අත්දැක්කේය. ව්‍යාපාර වලට රජයේ මැදිහත්වීම තරයේ පිටුදකින්නට පසු කාලීනව පෙළඹවූයේ ඔහුගේ මේ අත්දැකීම්ය.

එවක අමාත්‍යාංශ ලේකම්වරයකුව සිටි ඩී.එච්. බැල්ෆර් එන්. යූ. ගේ සරදමට දැඩිව ලක් වූ නිලධාරියකු විය. එන්. යූ. ඔහු හැඳින්වූයේ ''සිහින දකින සිවිල් නිලධාරියකු'' ලෙසය. කේම්බ්‍රිජ් විශ්ව විද්‍යාලයෙන් රසායන විද්‍යාව පිළිබඳ උපාධියක් ලැබූ බැල්ෆර් පසු කලෙක ව්‍යවසායකයකු බවට පත්ව සිටියේය. එන්. යූ. ඔහු ගැන සඳහන් කලේ ''උනන්දුව ඇතත් ව්‍යාපාරික තීරණ ගැනීමේ අසමතකු'' ලෙසය.

කන්කසන්තුරේ සිමෙන්ති කම්හල, පරන්තන් රසායන ද්‍රව්‍ය කම්හල, වාලච්චේනෙයි කඩදාසි කම්හල, ගාල්ලේ තුනීලෑලි කම්හල, කොළඹට නුදුරුව පිහිට වූ වානේ කම්හල, මීගමුවේ පිඟන් කම්හල හා නැගෙනහිර පළාතේ ඉල්මනයිට් කම්හල බැල්ෆර්ගේ මග පෙන්වීම යටතේ පිහිටුවනු ලැබූ කර්මාන්තශාලාය. මෙයින් සමහරක් කම්හල් 1980 දශකය දක්වා පාඩු ලබමින් හෝ පවත්වා ගෙන යන ලදී. එන්. යූ. විසින් තව දුරටත් පෙන්වා දුන් අන්දමට මේ කම්හල් වලින් බොහොමයක් පිහිටුවා තිබුනේ බලවත් දේශපාලනඥයින්ගේ මැතිවරණ කොට්ඨාශ තුළය (de Soysa manuscript, p.12).

Ceylon Trade Journal නමින් පලවු සඟරාවේ කතුවරයා ලෙසද එන්. යූ. මේ කාලය තුළ ක්‍රියා කළේය. වාණිජ සහ කර්මාන්ත දෙපාර්තමේන්තුව විසින් පළ කරන ලද මේ සඟරාව වාණිජ තොරතුරු දෙපාර්තමේන්තුවේ කටයුතු මත පදනම් විය. එන්. යූ. ගේ වෘත්තීය ජීවිතය තවත් බොහෝ අතුරු මාර්ග ඔස්සේ විහිදීම ආරම්භ වූයේ මේ කාලයේදී ය. නැගෙනහිර කලාපයේ යුධ උපකරණ සම්මේලනය 1940 නොවැම්බරයේදී ඉන්දියාවේ නව දිල්ලි නුවර මාසයක් පුරා පැවැත්විණි. මීට සහභාගී වූ ශ්‍රී ලංකා නියෝජිත පිරිසේ ලේකම් වශයෙන් ක්‍රියා කිරීමට එන්. යූ. තෝරා ගැනින.

**විශ්ව විද්‍යාල ආචාර්යවරයා :**

එන්. යූ. ආර්ථික විද්‍යාව උගත්තේ ස්වෝත්සාහයෙන් ගුරුවරයකු නොමැතිවය. වයස අවුරුදු 33 දී එනම් 1941 දී ඔහුට

ගුරුවරයෙකු වීමේ අවස්ථාව උදාවිය. ඒ කොළඹ යුනිවසිටි කොලීජියේ ආර්ථික විද්‍යා ඩිප්ලෝමා පාඨමාලාව සඳහා තාවකාලික කථිකාචාර්යවරයකු වශයෙන් පත් කරනු ලැබීමත් සමඟය. ශ්‍රී ලංකාවේ වෙළඳාම, වාණිජ්‍ය, කර්මාන්ත සහ ප්‍රවාහනය ඔහු ඉගැන්වූ විෂයයන් විය. බැංකු කොමිසමේ ලේකම් වශයෙන් කටයුතු කරද්දී එන්. යූ. ගේ ප්‍රධානියාව සිටි බී. බී. දාස් ගුප්තා මේ වකවානුව වන විට කොළඹ යුනිවර්සිටි කොලීජියේ ආර්ථික විද්‍යාව පිළිබඳ මහාචාර්ය තනතුර හොබවමින් සිටියේය. මේ වන විට යෙදී තිබුණ දහසකුත් එකක් කටයුතු අතර වුවද උගතුන් හා විද්වතුන් පිරිසක් අතර කටයුතු කරන්නට ලැබුනු මේ අවස්ථාව එන්. යූ. මහත් සතුටින් භාර ගන්නට ඇත. පසු කලෙක රජයේ ඉහල නිලතල දැරූ නිලධාරීන් රැසක් මේ කාලය තුළ එන්. යූ. ගෙන් අධ්‍යාපනය ලැබුවාට සැක නැත. කථිකාචාර්යවරයකු වශයෙන් එන්. යූ. ගෙන් සිදු වූ සේවය පිළිබඳව මහාචාර්ය දාස් ගුප්තා බෙහෙවින් පැහැදී සිටි බව ඔහු තැබූ සටහන් වලින් පැහැදිලිවේ. එන්. යූ. ගේ සාමාන්‍ය රාජකාරි හේතු කොටගෙන ආර්ථික ගැටළු පිළිබඳ ඔහුට නිරන්තර අවබෝධයක් ලැබෙන බවද, එන්. යූ. පුළුල් විෂය පරාසයක පොත් කියවීමෙහි යෙදී සිටින සමතුලිත චින්තනයක් ඇත්තකු බව ද දාස් ගුප්තාගේ සටහන් වල අඩංගුය. විශ්ව විද්‍යාල කථිකාචාර්ය පදවිය සාමාන්‍ය රාජකාරි ජීවිතයට වඩා බෙහෙවින් වෙනස් වූ පරිසරයක් එන්. යූ. ට විවෘත කළේය. උගතුන් සමග කෙරෙන නිරන්තර සාකච්ඡා සහ විවිධ විෂයයන් යටතේ ලියැවුනු පොත් විශාල සංඛ්‍යාවක් අඩංගු පුස්තකාලය පරිහරණය කිරීමේ අවස්ථාව මෙහිදී ඔහුට උදාවිය. එවකට කොළඹ යුනිවසිටි කොලීජියේ වැඩබලන ප්‍රධානියා වශයෙන් කටයුතු කරමින් සිටියේ ඉතිහාසය සහ ආර්ථික විද්‍යාව පිළිබඳ මහාචාර්යවරයකු වූ එස්.ඒ. පේක්මන්ය. ඔහු තැබූ සටහනක සඳහන් වනුයේ එන්. යූ. ගේ දේශන ''බෙහෙවින් ප්‍රබෝධජනක හා ප්‍රයෝජනවත්'' වූ බවයි.

ලංකා සිවිල් සේවය සැලකුනේ රාජ්‍ය සේවයේ මුදුන් මල්කඩ වශයෙනි. සිවිල් සේවය ප්‍රවේශ විභාගයට ආර්ථික විද්‍යා ප්‍රශ්න පත්‍ර දෙකක් සකස් කරන්නටත් ඒවායේ සම පරීක්ෂකයකු ලෙස කටයුතු කරන්නට, යුනිවසිටි කොලීජිය විසින් වරෙක එන්. යූ. ට ආරාධනා කරනු ලැබින. එකල එන්. යූ. ට මෙය තමන්ද සාමාජිකයෙකු නොවුන හෙයින් සිය ජීවිතයේ ලැබුණ විරල අවස්ථාවක් වන්නට ඇත.

මේ කාලය වන විට එන්. යූ. ගේ ජීවිතය විවිධාකාර වූ වගකීම් රැසකින් පිරී ගොස් තිබිණ. ඔහු වරෙක රජයේ කර්මාන්තශාලා සංවිධායක විය. තවත් වරෙක ඒවායේ නිපැයුම් අලෙවි කටයුතු සංවිධානය කළේය. ඒ අතරම ප්‍රකාශනයක කර්තෘවරයා වශයෙන් කටයුතු කල අතර, දේශන සකස් කර ගැනීම , ඉගැන්වීම හා ආර්ථික විද්‍යා ප්‍රශ්න පත්‍ර සකස් කිරීම ද සිදු කල යුතුව තිබිණ. මේ සියල්ල නොපිරිහෙලා ඉටු කරන්නට ඔහු තුළ පැවත්තේ පුදුම එලවන සුළු ශක්තියකි. යුධ සමය අතිශයින් කාර්යය බහුල මෙන්ම එක දිගට අර්බුද නිර්මාණය වූ අවිනිශ්චිත කාල පරිච්ඡේදයක් විය. එන්. යූ. විශේෂඥ දැනුම විවිධ ක්ෂේත්‍රයන් වෙත විහිදී ගිය පමණටම මේ කාලය තුළ ඔහුගෙ න් බලාපොරොත්තු වූ සේවාවන් ද අති මහත්විය.

**ශ්‍රී ලංකාවේ යුද සමය :**

හවායි හි පිහිටි පර්ල්වරයාට බලාපොරොත්තු නොවූ ප්‍රහාරයක් එල්ල කරමින් 1941 දී ජපානය දෙවන ලෝක සංග්‍රාමයට අවතීර්ණය විය. මෙතෙක් යම්තාක් දුරකට යුද්ධයෙන් දුරස්ව සිටි ආසියාවට මෙතැන් පටන් තදින් යුධ උණුසුම දැනෙන්නට පටන් ගත්තේය. ජපාන හමුදා ආසියාවේ සෑම ප්‍රදේශයකම බලය අල්ලා ගැනීමේ සීඝ්‍ර මෙහෙයුමක යෙදුනාහ. ඉන්දුනීසියාව, මැලේසියාව දැනට මියන්මාරය ලෙස හැඳින්වෙන බුරුමය මෙන්ම සිංගප්පූරුව ද ජපාන හමුදා යටතට පත්වූහ. සිංගප්පූරුව අල්ලා ගැනීමෙන් අනතුරුව ජපාන හමුදාවල ඊළඟ ඉලක්කය ශ්‍රී ලංකාව බවට කිසිඳු සැකයක් නොතිබිණි.

මෙම තත්වය යටතේ 1942 ජනවාරි මාසයේදී රට තුළ යුධ තත්ත්වයක් ප්‍රකාශයට පත් කෙරිණි. ශ්‍රීමත් ජෙෆ්රි ලේටන් හමුදාවේ ප්‍රධාන අණදෙන නිලධාරියා වශයෙන් පත්විය. සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව ස්ථාපනය කරනු ලැබූයේ ද මේ අවස්ථාවේදීය . විගණකාධිපතිවරයා වශයෙන් ඒ වන විට නමක් දිනා සිටි ඔලිවර් අර්නස්ට් ගුණතිලක සිවිල් ආරක්ෂක කොමසාරිස්වරයා වශයෙන් පත් කරනු ලැබින. ලන්ඩන් ස්කූල් ඔෆ් ඉකොනොමික්ස් විශ්ව විද්‍යාලයේ මහාචාර්යවරයකු වශයෙන් ක්‍රියාකල අයිවර් ජෙනිංන්ස් දිවයිනට පැමිණියෝ මීට ආසන්න කාලයේදී ය. ඔලිවර් ගුණතිලකගේ දෙවැනියා වශයෙන් කටයුතු කිරීම ඔහුට පැවරිණ.




උද්ගත වන ඕනෑම තත්ත්වයකට මුහුණදීම සඳහා නගරය මෙන්ම ගමද සූදානම් කල යුතු විය. අවශ්‍ය සෑම ස්ථානයකටම සේවක මණ්ඩලය බඳවා ගතයුතු විය. ගිනි නිවන සේවකයන් පුහුණු කිරීම සහ ඒ සඳහා අවශ්‍ය උපකරණ ලබාදීම ද අත්‍යවශ්‍ය කරුණක් විය. ආහාර සැපයීම් මෙන්ම බෙදා හැරීමේ ක්‍රමෝපායන්, ස්ථාපනය කරනු ලැබිණ. ගින්නකට මුහුණ දීම සඳහා මෙන්ම අනෙකුත් ආරක්ෂක කටයුතු සඳහා ද සියළුම අවශ්‍යතාවන් සපුරනු ලැබිණ. හදිසි අවස්ථාවකදී පාවිච්චි කල හැකි මහා පරිමානයේ මුළුතැන්ගෙ වල් හා රෝහල් පිහිටුවනු ලැබූයේ බෝම්බ දැමීමක් සිදුවහොත් එයට මුහුණදීමේ පියවර වශයෙනි. සිවිල් ආරක්ෂක කටයුතු වලදී නායකත්වය ලබාදීම පිණිස ප්‍රාදේශීය නායකයින් ඒකාරාශි කර ගැනීමට වෙනම ම ඒකකයක් ස්ථාපනය කෙරිණි. සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව විසින් පුද්ගලයින් 4000 ක් ස්ථිර ආරක්ෂක සේවය තුළට ග්‍රහණය කරගත් අතර ස්වේච්ඡා සේවය සඳහා බඳවාගත් සංඛ්‍යාව 64,000 ක් විය. දෙවුන්දර තුඩුවේ සිට පේදුරු තුඩුව දක්වා වූ සියළුම ප්‍රදේශවලින් තෝරාගත් ප්‍රාදේශියව කැපී පෙනුනු නායකයෝ මෙම පිරිසට අයත් වූහ (Jennings, 2005, p.126). ජනතාව අතර කටකතා සහ තැති ගැනීම් පැතිර යාම වැලැක්වීමේ සහ රහස්‍ය තොරතුරු සතුරා අතට පත්වීම වැලැක්වීමේ කාර්යභාරයද පැවරී තිබුනේ සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුවටය. මේ පිළිබඳ පණිවිඩ රැගත් පෝස්ටර් මහ ජනතාවගේ දැන ගැනීම උදෙසා කොළඹ නගරය පුරා අලවා තිබිණ. අත්‍යවශ්‍ය බඩු හිඟයක් පැවති අතර, ඒවා ජනතාව අතර බෙදා දීම සඳහා සලාක ක්‍රමයක් ක්‍රියාත්මක විය. මෙවැනි කාලයකදී කළු කඩකරුවන් විසින් බඩු සඟවා තබා ගැනීම ආණ්ඩුව මුහුණදුන් තවත් ගැටළුවක් විය.




විශේෂයෙන් ම කොළඹ හා ආසන්න අනෙකුත් ප්‍රදේශ වල වාසය කල ජනතාවට බොහෝ දුෂ්කරතාවන් ට මුහුණ දීමට සිදුවිය. ආහාර හිඟය මින් ප්‍රධාන වූ අතර වරින් වර විදුලි බලය විසන්ධිවීම ද සිදුවිය. ඒ අතරම ගුවන් ප්‍රහාර වලින් ගැලවීම සඳහා පුහුනුවන්නට සිදුවීම තවත් ගැටළුවක් විය. පැවති සහල් හිඟයට පිළියම් වශයෙන් බජිරි වැනි වෙනත් ධාන්‍ය වර්ග ඉන්දියාවෙන් ආනයනය කොට ජනතාව අතර ජනප්‍රිය කරවන්නට සිදු විය. දෙවන ලෝක සංග්‍රාම සමයේ යොවුන් වියේ පසුවූ නයිසින්ක් මහේන්ද්‍රරාජා ඒ කාලය පිළිබඳව මෙසේ පවසයි. ''ජීවන වියදම අහස උසට නැග තිබින. සාමාන්‍යයෙන් නැගෙනහිර පැවති වැදගත් වරායක් වූ කොළඹට නැව් නොපැමිණි හෙයින් දැඩි ආහාර හිඟයක් ඇතිවිය. නැව් ගමන් ඇරඹූ වද ගමනන්ත වරායට ලඟා වීමට කලින් ඒවා බෝම්බ වලට බිලිවිය. දවසේ ආහාරවේල් ගණන එකකට සීමා කරන්නට සිදුවූ අතර, ජීවත් වීම අරගලයක් විය. අල වර්ග ද ගම්වල වැවෙන එළවළු ද ප්‍රධාන ආහාරය බවට පත්විය.




ජපනුන් විසින් බෝම්බ හෙලතැයි යන අදහස් විසින් සියළු දෙනාම සිටියේ කිසියම් තැති ගැන්මකිනි. මෙම සිදුවීම් සියැසින්

දුටු තරුණ යුවතියක වූ හයිසින්ත් මහේන්ද්‍රරාජා ඒ පිළිබඳව මෙසේ සඳහන් කරයි.

> ''හදිසි ගුවන් ප්‍රහාරයකදී ළමුනට සැඟවී සිටීම උදෙසා පාසැල් වල දිගු අගල් කපන ලදී. ගුවන් ප්‍රහාරයක් සිදුවන අවස්ථාවකදී අනුග මනය කල යුතු ක්‍රියාමාර්ග පිළිබඳව අපට උපදෙස් ලබාදී තිබූ අතර සයිරන් හඬක් ඇසෙන ඕනෑම අවස්ථාවක එම උපදෙස් පිළිපැදිය යුතු විය. මෙම සයිරන් හඬ නිතර නිතර ඇසෙන්නට සලස්වන ලද්දේ සැබෑ ගුවන් ප්‍රහාරයකදී හැසිරිය යුතු ආකාරය පිළිබඳව මතකය අපේ මනසේ හොඳින් තැන්පත් කරන්නටයි.''




ප්‍රතිවිරුද්ධ පැත්තේ හා මෙහි, 120-123, යුධ සමයේ බ්‍රිතාන්‍ය පෝස්ටර්

දෙවන ලෝක සංග්‍රාම සමයේ කුඩා දැරියකව සිටි එන්. යූ. ගේ දියණිය නීලියා ගේ මතකයේ ගුවන් ප්‍රහාරයන් හොඳින් රැඳී තිබේ.




124. රජයේ වාරණය අනුව විවෘත කරන ලද ලිපියක්.

> ගුවන් ප්‍රහාර හැඟවෙන සයිරන් නැගෙන ඕනෑම අවස්ථාවක මමත් මගේ සහෝදරයින් දෙදෙනාත් අපගේ ඉස තබන කොට්ටද රැගෙන කෑම කාමරයේ මේසය යටට රිංගුවෙමු. එතැන නිරන්තරයෙන්ම අප සඳහා පැදුරු එලා තිබිනි. (නීලියා පෙරේරා, 2006)

**ශ්‍රී ලංකාවට එල්ලවූ ජපන් ප්‍රහාරය :**

මේ සියළු භීතිකාවන් සැබෑ කරමින් ජපානය ශ්‍රී ලංකා වෙත ප්‍රහාර එල්ල කරන විට ඒ පිළිබඳව තොරතුරු ඊට ප්‍රථම කොළඹට ලගා වී තිබිණ. ආරක්ෂක සංචාරවල යෙදෙමින් සිටි බ්‍රිතාන්‍ය ගුවන් නියමුවකුට දෙවුන්දරට ගිණිකොන දෙසින් ශ්‍රී ලංකාව වෙත ලගා වෙන ජපන් නාවික බල ඇණියක් දක්නට ලැබිණ. ඔහු පියාසර කල ගුවන්යානය, ජපනුන් විසින් වෙඩි තබා බිම හෙලන්නට කලින් එම පණිවිඩය ගුවන් විදුලි තරංග දිගේ වූ මූලස්ථානය කරා එවන්නට ඔහු සමත් විය. ඔලිවර් ගුණතිලක සටහන් කර තිබූ අන්දමට අපේ දිවයිනට ආරක්ෂාවක් නොපැවතියේය. ඔහු තවදුරටත් පවසන්නේ අපට තිබූ හමුදා සම්පත් ආක්‍රමණයකට මුහුණ දීමට කිසිසේත්ම නොසෑහුනු බවයි (Jeffries, 1958, p.58).




125. යුධ සමයේ බ්‍රිතාන්‍ය පෝස්ටරයක්.

1942 අප්‍රේල් 5 වන දා පාස්කු ඉරිදා ජපන් හමුදාම ශ්‍රී ලංකාව ට ප්‍රහාර එල්ල කිරීම ආරම්භ කළේය. ජපන් ගුවන් යානාවල ඉලක්කය වූයේ කොළඹ වරාය සහ රත්මලාන ගුවන් තොටුපලයි. ඔවුන්ගේ ඊළඟ ඉලක්කය වූයේ ත්‍රිකුණාමලය වරායයි. කෙසේ වුවද ප්‍රහාර දෙකෙන්ම විනාශයට පත්වූයේ නැව් කිහිපයක් පමණකි. මිය ගිය සාමාන්‍ය ජනතාවගේ සංඛ්‍යාව ද ඉතා අවම විය. කොළඹ ට එල්ල කල ප්‍රහාරය පැවතුනේ ඉතා කෙටි කාලයක් වුවද ඉතා දැඩි එකක් විය. රැයක් එළිවන විට කොළඹ ජන ශූන්‍ය නගරයක් බවට පත්විය. එහිදී ඇතිවූ තත්වය ජෙනිංන්ස් විස්තර කරන්නේ මෙසේය.

> ගුවන් ප්‍රහාරය නිම වීමත් සමග මෝටර් රථ පෙරහැරක් සේ සියලුම ප්‍රධාන මාර්ග දිගේ කොළඹින් පිටවන්නට පටන් ගත්හ. කරත්ත තිබූ පුද්ගලයෝ තමන්ගේ පවුල් ද බඩුභාණ්ඩද ඒවායේ පටවාගෙන ගමන් ඇරඹූහ. කිසිදු ප්‍රවාහන මාධ්‍යක් නොමැති ජනතාව ගෙන යා හැකි දේ හිසමත තබාගෙන කොළඹින් පිටවූහ. කොළඹ පදිංචිකරුවන්ගෙන් තුනෙන් දෙකක් එම දිනය තුළ නගරය හැර ගියහ. මින් සමහර දෙනෙකුට ආපසු යන්නට ගම්බිම් තිබිණ. නමුත් බොහෝ දෙනෙක් ගමන ඇරඹුවේ කොහෝ යන්නට දැයි නොදැනයි (Jennings2005, p.131). ජනතාව මෙසේ පලායාම නිසා ඇතිවූ ප්‍රතිඵල බෝම්බ ප්‍රහාරයෙන් සිදුවූ හානියට වඩා බරපතල විය. පැවති ආහාර හිගය උග්‍ර කරමින් බොහොමයක් පලගොස් තිබින. අත්‍යවශ්‍ය සේවා පවත්වාගෙන යාම පිණිස අවශ්‍ය වූ සේවක ජනතාවද නගරය හැර ගොස් සිටියහ. මෙම අර්බුදය විසැඳීම සඳහා වසා තිබූ කඩසාප්පු විවෘත කිරීමේ ලබා දෙන්නට ඔලිවර් ගුණතිලකට සිදුවිය. එපමණක් නොව විගණකාධිපති දෙපාර්තමේන්තුවේ සියලු සේවකයන් මේ කඩසාප්පු වල සේවය කිරීම සඳහා යොදා ගනු ලැබිණ. (Jennings, p.131)

බොහෝ රජයේ සේවකයින් මෙන්ම එන්. යූ. සිය පවුල කෙටි කලකට ගමට යැවීය. නමුත් ඔහුට කොළඹින් පිටත්වන්නට ඉඩක් ලැබුනේ නැත. සිය මවත් සහෝදරයින් දෙදෙනාත් සමඟ ගම්පහ ප්‍රදේශයේ කොස්කඳවල නම් ගම්මානයට යවනු ලැබූ ආකාරය එන්. යූ. ගේ දියණිය නීලියා සිහිපත් කරයි. එන්. යූ. ගේ බිරිඳගේ දෙමාපියන් දන්නා හඳුනන පවුලක් සමඟ එම කාලය ගත කිරීමට ඔවුනට සිදුවිය. සති අන්තයේ ඉඩක් ලැබුණු විටෙක එන්. යූ. බිරිඳ හා දරුවන් බැලීමට ගියේය.

මෙම කාලපරිච්ඡේදය තුළ සිදුවූ සිද්ධීන් සලකා බලද්දී පෙනී යන්නේ ශ්‍රී ලංකාව ජපානයට යටත් වීමට ඉතා ආසන්න තත්වයකට පැමිණි බවයි. මේ තත්වය වැලකීයන්නේ එක්තරා අන්දමක වාසනාවක් මෙන්ම යුධ තත්ත්වයේ සිදුවෙමින් පැවති වෙනස්වීම් හේතුකොටගෙනය. ශ්‍රී ලංකාව ජපන් ප්‍රහාරයට ලක්වුනු අවස්ථ ාව යුද්ධයේ දී ඔහු මුහුණ දුන් ඉතාමත් අන්තරායකාරී අවස්ථ ාවකැයි බ්‍රිතාන්‍ය අග්‍රාමාත්‍ය වින්ස්ටන්ට් චර්චිල්ගේ එක් සුප්‍රසිද්ධ ප්‍රකාශයක සඳහන් ය. කාලයේදී මිත්‍ර හමුදා විසින් ජපන් හමුදාවල

ඉදිරි ගමන නැවැත්වූ බව මෙතැන් සිට ආපසු හැරී බලන විට අප දන්නා කරුණකි. නමුත් ජපන් හමුදාව ශ්‍රී ලංකාවට නැවත පහර දෙන්නට නොපැමිණෙතැයි කිසිවකුටවත් විශ්වාසයෙන් කිව නොහැකිවිය. එහෙයින්, වසර තුනකට පසුව 1945 දී ජපානය මිත්‍ර හමුදා අතින් පරාජයට පත්වන තුරුම ශ්‍රී ලංකාව තුළ යුධ තත්වය පවත්වාගෙන යනු ලැබිණ.



126. බ්‍රිතාන්‍ය යුධ නැව් කොළඹ වරායේ.

රට යුද තර්ජනයෙන් ඇලලී තිබුණද, බොහෝ දරුවනට මෙන්ම නීලියාට සහ ඇගේ සහෝදරයින් දෙදෙනාටද මේ කාලය ඉතා සුන්දර වූවක් විය.

> ''ඇල දොල වල බැස මාලු ඇල්ලීම ද, වසු පැටවුන් සමඟ සෙල්ලම් කිරීම ද අනෙක් ළමයින් සමඟ එක්ව ක්‍රීඩා කිරීමට ද අතිශයික් ප්‍රීති ජනක බව අප වටහා ගත්තේ කොස්කඳවල ගත කල මෙම කාලය තුලදී ය. අම්මා අපට බොහෝ සුන්දර දේ හඳුන්වා දුන්නාය. අපේ මුළු ජීවිතය ද සියලු ක්‍රියාකාරකම් ද ඇය වටා රැඳී තිබින (Neiliya Perera, 2006)



127. කොටුවේ තොග වෙළඳුන්.

ගම්මානයේ ගත කළ කාලය දරුවන් තුල නොමැකෙන බලපෑමක් ඇති කල බව පැහැදිලිය. ඒන්. යූ. ජයවර්ධන පවුල ජීවත් වූ කොළඹ පොලිස් උද්‍යාන පාරේ නිවස විශාල වත්තක පිහිටි තනි තට්ටුවේ සුන්දර නිවසක් විය. යුද්ධය නිම වී කොළඹට පැමිණි පසුව සිදු වූ සිද්ධීන් ගෙන් මෙය පැහැදිලිය. නීලියා ඒ සම්බන්ධයෙන් මෙසේ සඳහන් කරයි.

> ''කොළඹට පැමිණි පසුව අම්මා මුලින්ම කලේ කිරි ලබා ගැනිම පිණිස එළු දෙනෙක මිලදී ගැනීමයි. එළු දෙනට කුඩා පැටවුන් තිදෙනෙකු සිටි අතර අප තිදෙනා ඔවුන් එකා බැගින් අයිති කර ගත්තෙමු. අපේ නිවසට සතුන් පැමිණීම ඇරඹුනේ එතැන් සිටය. මුලින්ම ගෙන එනු ලැබුවේ බල්ලන්ය. ඉන් පසුව අපේ නිවසේ බල්ලන් ඇති දැඩි කරනු ලැබින. අනතුරුව කිරි ලබා ගැනීම සඳහා එළදෙනුන් දෙදෙනෙකු මිලදී ගන්නා ලදී. හාවුන් මුවන්, පමණක් නොව වරෙක වලස් පැටවකු ද සුරතලයට හදාවඩා ගැනින. වසර ගණණාවක් තිස්සේ ගිරවුන් සංඛ්‍යාවක් අප සමඟ සිටි අතර, ''පෝලි'' නමින් හැඳින්වුනු එක් ගිරවකු ''නිමල්'' ''නන්නා'' යනුවෙන් ඇයගේ ප්‍රියතමයන්ගේ නම් වඩාත්ම සුන්දර සතුන් සහ කුරුල්ලන් අයත් වූයේ මගේ අයියා නිමල්ට ය. අද වනතුරුත් සුන්දර කුරුල්ලන් සහ මසුන් එකතු කිරීම ඔහුගේ විනෝදාංශයයි''. (ibid)

දරුවන් වැඩෙන කාලය තුලදී ඒන්. යූ. ගේ වෘත්තීය ජීවිතය අතිශයින්ම කාර්ය බහුල විය. මේ ඒ පිළිබඳව නීලියාගේ තවත් මතක සටහනකි.

> ''මගේ පියාගේ ජීවිතය සෑම විටම රාජකාරි වලින් පිරී කාර්ය බහුල වී තිබින. එම නිසා අම්මාගේත් තාත්තාගේත් දෙදෙනාම වූයේ අම්මාය. මගේ පියා සතියේ දින හතම උදේ සිට රෑ වන තුරුම රාජකාරි යෙදුනු බවත්, මගේ දෙවන සහෝදරයා වන නිමල් අවදිවන්නට පෙර නිවසින් පිටව ගොස් ආපසු නිවසට පැමිණෙන්නේ ඔහු නින්දට ගිය පසුව බවත්, එහෙයින් නිමල් තමන් දිනපතා වැඩියෙන් දකින පිරිමි චරිතය වන තැපැල්කරු ''තාත්තා'' කියන්නට පටන් ගත් බවට ද කතාවක් සෑදින.'' (ibid)

**ඔලිවර් ගුණතිලක :**

ඔලිවර් ගුණතිලක තමාට ප්‍රථමයෙන් හමුවූයේ දෙවන ලෝක සංග්‍රාම සමයේදී බව එන්. යූ. සඳහන් කරයි. භාණ්ඩ මිලදී ගැනීමේ දෙපාර්තමේන්තුවේ, නියෝජ්‍ය කොමසාරිස් තනතුරට එන්. යූ. අනුයුක්ත කරනු ලැබුයේ ඔලිවර් ගුණතිලක නිර්දේශය මතය. 1943 දී එන්. යූ. රැකියාවකට ඉදිරිපත් කල ඉල්ලුම් පත්‍රයක සහතික කරන්නකු (Refrees) ලෙස ඔලිවර් ගුණතිලකගේ නම සඳහන් කොට තිබිණ.

ඔලිවර් ගුණතිලක යටත් විජිත පරිපාලන සේවය තුළ කැපී පෙනන චරිතයක් විය. එපමණක් නොව යුද්ධ කාලය තුළ සහ ඉන් අනතුරුව ශ්‍රී ලංකාවේ දේශපාලන ක්ෂේත්‍රය තුල ආධිපත්‍ය පැතිරවූවෙක් ද විය. එන්. යූ. සහ ඔලිවර් ගුණතිලක අතර සබඳතාවට මුල පිරෙන්නේ ඔලිවර් සිවිල් ආරක්ෂක සහ ආහාර කොමසාරිස්වරයා වශයෙන් කටයුතු කල සමයේදී ය. සිය වෘත්තීය ජීවිතයන්හි ඉහලට ගමන් කරන අවස්ථාවේ දී එකිනෙකාට සමීපව කටයුතු කිරීමට ඔවුනට සිදුවිය.

දරුවන් අට දෙනෙකුගෙන් යුතු පවුලක එකම පිරිමි දරුවා වශයෙන් ඔලිවර් ගුණතිලක 1892 දී කෝට්ටේ දී උපත ලැබීය. තැපැල් ස්ථානාධිපතිවරයකු වූ ඔහුගේ පියා ක්‍රිස්තියානු ලබ්ධිකයකු විය. කොළඹ වෙස්ලි විද්‍යාලයට ඇතුලත් කරන ලදුව ඔලිවර් පාසලට පැමිණියේ දුම්රියෙනි. පියාගේ ආර්ථිකය ශක්තිමත් එකක් නොවූ හෙයින් සත 5 ක් වූ ට්‍රෑම් කාර් ගාස්තුව ඉතිරි කර ගැනීම පිණිස දුම්රිය ස්ථානයේ සිට පාසැලට පයින් ගමන් කිරීම ඔලිවර් ගේ සිරිත විය. ඔලිවර් ලන්ඩන් විශ්ව විද්‍යාලයෙන් සිය උපාධිය ලබාගත්තේ එන්. යූ. මෙන්ම බාහිර සිසුවකු වශයෙනි. ඔහු ටික කලක් වෙස්ලි විද්‍යාලයේ ගුරුවරයකු වශයෙන් ද ක්‍රියා කළේය. 1924 වර්ෂයේදී ඔලිවර් ගුණතිලක සහකාර යටත් විජිත විගණකාධිපතිවරයා වශයෙන් පත්විය. මේ වූ කලී මෙතෙක් බ්‍රිතාන්‍ය නිලධාරීන් විසින් පමණක්ම හොබවන ලද තනතුරකි. 1926 දී ලන්ඩන් ස්කූල් ඔෆ් ඉකොනොමික්ස් විශ්ව විද්‍යාලයේ විශ්ව විද්‍යාලයෙන් පශ්චාත් උපාධි ලබාගන්නා ඔලිවර් 1931 දී යටතේ විජිත විගණකාධිපති තනතුරට පත්වීමේ අවස්ථාව උදාවින. (දැනට විගණකාධිපති ලෙසින් හැඳින්වෙන්නේ මෙම තනතුරයි) එතැන් සිට වසර 11 ක් ඔහු මෙම තනතුර දැරිය. ඔලිවර් ගුණතිලක චරිතාපදානය රචනා කල ශ්‍රීමත් චාල්ස් ජෙෆ්රි ඒ පිළිබඳව මෙසේ සඳහන් කරයි.

> ''ඔලිවර්ගේ නව පත්වීම එතෙක් පැවති ප්‍රතිපත්ති වල සිදු වූ නව වෙනසක් ලෙස මෙන්ම ලාංකික ජනතාවටත් ජයග්‍රහනයක් ලෙසද පිළිගනු ලැබිණ. ශ්‍රී ලංකාවේ මෙන්ම අනෙකුත් යටත් විජිත වලද ආණ්ඩුවේ ඉහල තනතුරු වලට බ්‍රිතාන්‍ය යටත් විජිත සේවයේ නිලධාරීන් පමණක් පත් කල යුතු බව එතෙක් පැවති අදහසයි.'' (Jeffries, 1969, p.38)

ඔලිවර් ගුණතිලක සහ එන්. යූ. ජයවර්ධන වෘත්තීය සබඳතාවය ආරම්භ වූ තැන් සිට වසර ගණනාවක් ඉදිරියට පැවතින. එසේ වුවද ප්‍රතිපත්ති සහ ආහාර සහනාධාර විශේෂයෙන් ම සහල් සහනාධාරය පිළිබඳව ඔලිවර් ගේ මතය සමග එන්. යූ. එකඟ වූයේ නැත. ඔහුගේ අදහස වූයේ යුද්ධය නිමා වීමෙන් පසුව මෙම සහනාධාර ක්‍රමයෙන් අඩු කල යුතු බවයි. එසේ නොකලහොත් රටේ ආර්ථිකයට අත්විය හැකි අහිතකර පල විපාක ඔලිවර්ට පෙන්වා දීමට එන්. යූ. උත්සාහ කළේය. මෙයින් උග්‍ර දේශපාලන අර්බුදයක් ද නිර්මාණය විය හැකි බව එන්. යූ. ගේ අදහස විය.

**එන්. යූ. ගේ වෘත්තීය ජීවිතය :**

ජපානය ශ්‍රී ලංකාවට පහර දීමෙන් මසකට පසුව එන්. යූ. වාණිජ සහ කර්මාන්ත දෙපාර්තමේන්තුවේ ඉහළ තනතුරකට පත් කරනු ලැබිණ. ඒ හැරුණු විට භාණ්ඩ මිලදී ගැනීමේ දෙපාර්තමේන්තුවේ නියෝජ්‍ය කොමසාරිස් තනතුරකට ද ඔහු අනුයුක්ත කරන ලදී. බ්‍රිතාන්‍යයේ ආහාර දෙපාර්තමේන්තුවට අවශ්‍ය ඩෙසිකේටඩ් පොල් සහ කොප්පරා ලබාදීමේ වගකීම මෙහිදී එන්. යූ. ට පැවරුන පසු කාලයක තැබූ සටහනක එන්. යූ. ඒ පිළිබඳව මෙසේ සටහන් කරයි.

''මුල් කාලයේදී දෙපාර්තමේන්තුවේ ව්‍යුහය සැලසුම් කිරීම භාණ්ඩ මිලදී ගැනීමේ නියෝජ්‍ය කොමසාරිස්වරයා වශයෙන් මට පැවරී තිබින. කොප්පරා, තෙල් සහ මිනිරන් මිලදී ගැනීමේ ක්‍රම සංවිධානය කිරීමට වැඩි අවධාරණයක් ඇතිව මෙය සිදුකල යුතුවිය. පසු කලෙක දෙපාර්ථමේන්තුවේ කටයුතු ප්‍රතිසංවිධානය කිරීමට මට සිදුවිය. මේ සඳහා දෙපාර්ථමේන්තු කටයුතු වලට අදාල නීති සංග්‍රයක් සම්පාදනය කළෙමි.''

ව්‍යාපාරයක ස්වරූපයෙන් ක්‍රියාත්මක වූ භාණ්ඩ මිලදී ගැනීමේ දෙපාර්ථමේන්තු කටයුතු පිළිබඳව සහ එහි කාර්ය මණ්ඩලය පිළිබඳව ඔහු මෙසේ සටහන් කොට තිබේ.

''පූර්ණ කාලීන කොමසාරිස්වරයකු සහ නියෝජ්‍ය කොමසාරිස් තනතුර දැරූ මා ද ඇතුළුව මාණ්ඩලික නිලධාරීන් 11 දෙනෙක් දෙපාර්තමේන්තුවේ සේවය කළහ. ගබඩාවල සේවය කල සංඛ්‍යාව 112 ක් වූ අතර ලිපිකර පංතිය සේවකයින් 117 කින් සමන්විත විය. දෙපාර්තමේන්තු වාර්තා කල සාමාන්‍ය වාර්ෂික ආදායම රුපියල් මිලියන 50 ඉක්මවනු ලැබින. ( NU Jayawardena Personal files)

භාණ්ඩ මිලදී ගැනීමේ දෙපාර්තමේන්තුව පිහිටා තිබුනේ කොළඹ කොටුවේ කාර්ගිල්ස් වෙළඳසැළ ඉදිරිපිට පිහිටි බ්‍රිස්ටල් හෝටල් ගොඩනැගිල්ලෙහිය. දෙපාර්තමේන්තු අධ්‍යක්ෂකවරයා වූ එල්. ජේ. බී. ටර්ගර් යටතේ එන්. යූ. කලක් රෙජිස්ට්‍රාර් ජනරාල් කාර්යාලයේ සේවය කොට තිබුණි.

එන්. යූ. ගේ වෘත්තීය නැගීම අතිශයින් සීඝ්‍ර එකක් විය. කෙටි කලකින් තම ප්‍රධානීන් ලෙස කටයුතු කල පුද්ගලයින් හා සම තත්ත්වයට පැමිණි ඔහු තවත් කෙටි කලකින් ඔවුන් පසුකොට වෘත්තියේ ඉහළට නගින්නට සමත්විය. යුධ අවදානම් රක්ෂණ කොමසාරිස්වරයා ලෙස කටයුතු කල එෆ්. ලෙයිච් 1946 දී ආපසු සිය රට බලාගිය අතර එම තනතුරේ වැඩ බලන්නට එන්. යූ. පත් කරනු ලැබිණ. ජීවිතයේ මුල්ම කාලයේ දී හම්බන්තොට දිස්ත්‍රික් මාර්ග කමිටුවේ කණිෂ්ඨ ලිපිකරු තනතුරට අයදුම් කල අවස්ථාවේදී එම තනතුර එන්. යූ. ට ලබා නොදී ඒ සඳහා මුදලිවරයකුගේ පුතකු පත්කරන්නට උත්සාහ කලේ මේ එෆ්. ලෙයිච් බව සඳහන් කල යුතුය.

**වෘත්තීය ජීවිතයේ තවත් වැදගත් සංධිස්ථානයක් :**

1946 දී මූල්‍ය සහ සැපයුම් (ආර්ථික) පාලක තනතුරක් නිර්මාණය කරනු ලැබිණ. දරන තනතුරු වලට අමතරව මෙම තනතුරෙහි ද වැඩ බැලීම එන්. යූ. ට පැවරින. මෙය එන්. යූ. භාණ්ඩාගාර දෙපාර්තමේන්තුවේ ලත් පළමුවන පත්වීමයි. භාණ්ඩාගාර දෙපාර්තමේන්තුව සිවිල් සේවයේ මුදුන්මල්කඩසේ සැලකුනු හෙයින් හෙතෙම අතිවිශාල තෘප්තියක් ලබන්නට ඇත. මේ ආකාරයෙන් ''පිටස්තරයකුට'' උසස්වීම් ලබාදීම සහ තනතුරු ගණනාවක් ලබාදීම සිවිල් සේවය ඉහළ නිලධාරීන්ගේ සතුටට කරුණක් නොවීය.

මෙම නොකැමැත්ත තවත් වැඩිවන්නට හේතු වූයේ තමන් දැරූ තනතුරු වලින් ඔහු ලද ඒකාබද්ධ වැටුප ඔහුගේ ඉහළ නිලධාරීන්ගෙ වැටුපට වඩා තරමක ඉහළ වීමය. (එන්. යූ. ජයවර්ධන, 11 මැයි 1987, p.3) එන්. යූ. සිය ජීවිතයේ උසස්වීම ලැබුයේ සිවිල් සේවා විභාගය සමත්වීමෙන් නොව පැහැදිලිව ඔප්පු කල හැකියාව මතයි. වෙනත් වෙනත් දෙපාර්ථමේන්තු 4 ක ප්‍රධානියා ලෙස කටයුතු කිරීමෙන් ඔහු ඉපැයූ අදායම සිවිල් සේවයේ පළමුවන පන්තියේ, දෙවන ශ්‍රේණියේ නිලධාරියකුගේ වැටුපට සමාන විය. සිවිල් සේවයේ සාමාජිකයකු නොවූ එන්. යූ. ලැබූ මේ වරප්‍රසාදයට විරුද්ධව සිවිල් සේවා සංගමය විසින් දැඩි විරෝධතාවයක් දියත් කරනු ලැබිණ. එවකට සිටි වැඩ බලන මුල්‍ය ලේකම් සී ඊ. ජෝන්ස් ද සම්බන්ධ වූ එක්තරා සිද්ධියක් පිළිබඳව එන්. යූ. සිය වදනින්ම සටහන් තබා ඇත. මෙය වූ කලී සාම්ප්‍රදායික ඉහල පැලැන්තියේ සිවිල් සේවකයා විස්ථාපනය කරමින් විශේෂඥ තාක්ෂනඥයා සිහසුන හිමි කර ගැනීම විදහා දක්වන හොඳම සංසිද්ධියයි.




වම හා දකුණ ៖ 129-130, අපතේ යැවීම් සම්බන්ධව එරෙහි වන යුධ සමයේ පෝස්ටර්

> අතිශයින් සංකීර්ණ වූ ආර්ථික සබඳතා පිළිබඳ නිල වාර්තා අඩංගු ලිපි ගොනුවක් වැඩ බලන මුල්‍ය ලේකම්වරයාගේ මේසය මත විය. ලිපි ගොනුව විශාල ප්‍රමාණයේ එකක් වූ අතර, ඒවා තිබුණේ රාජ්‍ය ලේකම් වරයා යටතේය. මෙම වාර්තා අධ්‍යයනය කොට විශ්ලේෂණයට භාජනය කර සවිස්තරාත්මක ආණ්ඩුකාරවරයා වෙත යැවීම සඳහා මුල්‍ය ලේකම්වරයාගේ අත්සනට වාර්තාවක් සැකසීම මා වෙත පැවරින. එමෙන්ම දීර්ඝ වාර්තාවක් රාජ්‍ය ලේකම්වරයා වෙතද සැපයිය යුතුව තිබිණ. මූල්‍ය ලේකම්වරයාට ඉහත කී විෂය පිළිබඳව කිසිඳු දැනුමක් නොවූ හෙයින්, මා විසින් සපයන වාර්තාව පිළිබඳ සැකයෙන් තොරව විශ්වාසය තැබීමට ඔහුට හැකියාව තිබිය යුතු විය. විරෝධතාවය දැක්වීම සඳහා තමන් වෙත පැමිණි නිලධාරි පිරිස අතට මෙම ලිපි ගොනුව භාරදුන් වැඩ බලන මුල්‍ය ලේකම්වරයා ඔවුනට පැවසුවේ එම කාර්යය මා සිදුකල ආකාරයට වඩා හොඳින් කල හැකි කිසියම් නිලධාරියකු ඔවුන් අතර හෝ ඔවුන්ගේ හිතවතුන් අතර වේ නම් මා එහි දැරූ තනතුරු ද මා දැරූ අනෙක් තනතුරු ද ඒ හා සම්බන්ධව මා ලැබූ මුළු වැටුප ද එම නිලධාරියාට ලබාදිය හැකි බවද ඔහු පැවසීය. (ibid)

මෙම සිද්ධියෙන් පසුව කිසි විටෙකත් තමන් හා සම්බන්ධ කිසිම කාර්යකට සිවිල් සේවා සංවිධානය ඉදිරිපත් නොවූ බව එන්. යූ. ජයග්‍රාහී අයුරින් පවසා ඇත. ඔහු මේ සිද්ධියෙන් කම්පනයට පත්වූයේ ද නැද්ද යන්න කිව නොහැකි නමුත් සිවිල් සේවා සංවිධානය සතුව තිබූ සාධාරණභාවය පිළිබඳව මෙය හොඳ උදාහරණයක් බව එන්. යූ. සටහන් කොට තිබේ. කෙසේ වෙතත්, රාජ්‍ය සේවයේ ඉහල නිල දැරීම හා සම්බන්ධ අන්තරායයන් සහ කරදර පිළිබඳ මෙම සිද්ධිය ඔහුට වැදගත් පාඩමක් වන්නට ඇත.


Switch off that
LIGHT!
LESS LIGHT – MORE PLANES